| |
|---|
| මෙම අයදුම්පත නොමිලේ නිකුත් කරනු ලැබේ. |

පෝරම අංක:- FRAG/01

අනු අංකය:-

**1958 අංක 2 දරණ තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පනතේ 2005 අංක 20 දරණ සංශෝධනයට අනුව ඔප්පුවකින්, ආයතනික ක්‍රියාමාර්ගයකින් අයිතිය පැවරීමේ අයදුම්පත්‍රය**

සභාපති,
තේ,රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
10 වන මහළ, සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.

1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :-
(ඉඩමේ නීත්‍යානුකූල අයිතිකරු)
2) ලිපිනය :-
3) ජාතික හැඳුනුම්පත් අංකය :-
4) දුරකථන අංකය :-
5) ඉඩමේ නම :-
6) කැබලි කිරීම සඳහා ඉල්ලුම් කරන ඉඩමේ අයිතිය ඉල්ලුම්කරුට හැර වෙනත් අයට තිබේනම්, එහි සියළුම අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන්

| අනු අංකය | සම්පූර්ණ නම | ජා.හැ අංකය | ලිපිනය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

7) ඉඩමේ ප්‍රමාණය :- (2005.07.22 දින හෝ එදිනට පෙර පැවති ප්‍රමාණය)

| අක්කර | රූඩ | පර්චස් | හෙක්ටයාර |
|---|---|---|---|
| | | | |

8) ඉඩමේ වර්තමාන ප්‍රමාණය :-

| අක්කර | රූඩ | පර්චස් | හෙක්ටයාර |
|---|---|---|---|
| | | | |

9) ඉඩමේ පිහිටීම පිළිබඳ විස්තර :-

9.1 දිස්ත්‍රික්කය :-
9.2 ප්‍රා.ලේ. කොට්ඨාශය :-
9.3 ප්‍රාදේශීය සභාවේ නම :-
9.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශය :-
9.5 ගම :-
9.6 ඉඩම් රෙජිස්ට්‍රාර් කොට්ඨාශය :-
9.7 ඉඩමට ලඟාවිය හැකි මාර්ගය :-

(ආසන්න නගරයේ සිට ඉඩමට ලඟාවිය හැකි මාර්ග සටහනක් අමුණා එවිය යුතුය)

10) හිමිකම් කියනු ලබන ඉඩමට අදාල ඔප්පු, පිඹුරු හා හිමිකම් වාර්තාව පිළිබඳ විස්තර:-

10.1 ඔප්පු අංක හා දින:-
10.2 පිඹුරු අංක හා දින:-
10.3 හිමිකම් වාර්තාව සකස්කළ දිනය:-

(අදාළ ඔප්පු වල සහ පිඹුරු වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවිය යුතුය. නොතාරිස්වරයෙකු ලෙස වසර 10 ක පළපුරුද්දක් ඇති නීතිඥවරයෙකු විසින් සහතික කරන ලද හිමිකම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.)

11) ඉඩමේ වගා කර ඇති භෝග පිළිබඳ විස්තර

11.1 තේ/පොල්/ රබර්/ වෙනත් :-
11.2 වගාකර ඇති බිම් ප්‍රමාණය :-

| අක්කර | රූඩ් | පර්චස් | හෙක්ටයාර |
|---|---|---|---|
| | | | |

11.3 වගාවන්හි වර්තමාන තත්ත්වය :-
11.4 පසුගිය වර්ෂ තුනක සම්පූර්ණ ඵලදාව:-

12) ඉඩමේ පිහිටි ප්‍රධාන ගොඩනැගිලි හා ඒවායේ තත්ත්වය

12.1 ගොඩනැගිලි සංඛ්‍යාව :-
12.2 එම ගොඩනැගිලි වල වර්ග ප්‍රමාණය :-
12.3 එම ගොඩනැගිලි වල වර්තමාන තත්ත්වය :-

13) මෙම පැවරීමට අදාලව මෙම මණ්ඩලයට මීට පෙර අයදුම්පතක් ඉදිරිපත් කර තිබේද?

ඔව් ☐ නැත ☐

ඉදිරිපත් කර ඇත්නම් ලිපිගොනු අංකය:-

14) මෙම අයදුම්පත මගින් අයිතිය පැවරීම සිදුකරන ආකාරය පිළිබඳ විස්තර

14.1 දරුවන් සහ පවුලේ අය අතරද? :- ඔව්/ නැත
පසුපිට උපදෙස් මාලාව බලන්න - (ඉඩමේ අයිතිය හිමිව ඇත්තේ 2005.07.22 දිනට පසුව නම් ඊට පෙර අයිතිය දැක්වෙන ඔප්පු හා පිඹුරු වල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය)

14.2 වෙනත් අයට ඉඩම් පැවරීමක් ලෙසටද? ඔව්/ නැත
14.3 උකස් කිරීමක් ලෙසටද? ඔව්/ නැත

15) අදාල ඉඩම මිලදී ගනු ලබන්නේ කුමන කාරණයකටද? (නිවැරදි කාරණය ලකුණු කරන්න)

15.1 කැබලි කර විකිණීමට
15.2 තවදුරටත් තේ/ රබර් / පොල් වගාව සංවර්ධනය කිරීමට
15.3 තේ/ රබර් / පොල් වගාව ඉවත් කර වෙනත් සංවර්ධන කාර්යයකට
15.4 වෙනත් (වෙනත් කාර්යය කුමක්ද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුය)

16) 2005 ජුලි 22 දිනෙන් පසුව මෙම ඉඩමෙන් යම් කොටසක් කැබලි කර තිබේද? ඔව්/ නැත

17) ඉඩම මිලදී ගනු ලබන හෝ ඉඩම ත්‍යාගයක් ලෙස ලබන හෝ උකස් ගනු ලබන හෝ පුද්ගලයින්ගේ/ ආයතනයන්ගේ නම, ලිපිනය සහ ඒ ඒ අයට ලබා දීමට බලාරොත්තුවන ඉඩම් ප්‍රමාණය සටහන් කරන්න.

| අනු අංකය | අයිතිය ලබන පුද්ගලයාගේ/ ආයතනයේ නම | පුද්ගලයාගේ ජා.හැ. අංකය | ලිපිනය | අක්. | රූඩ් | පර්. | හෙක්ටයාර |
|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | |
| 02 | | | | | | | |
| 03 | | | | | | | |
| 04 | | | | | | | |
| 05 | | | | | | | |
| 06 | | | | | | | |
| 07 | | | | | | | |

ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

....................................... ..........................................

අයිතිකරුගේ අත්සන දිනය

හවුල් අයිතිකරුවන් සිටී නම්,

| <u>නම</u> | <u>අත්සන</u> | <u>දිනය</u> |
|---|---|---|
| 01 ................................................ | .................................. | ............................ |
| 02 ................................................ | .................................. | ............................ |
| 03 ................................................ | .................................. | ............................ |
| 04 ................................................ | .................................. | ............................ |
| 05 ................................................ | .................................. | ............................ |

ඉහත අයදුම්කරු/ අයදුම්කරුවන් මා ඉදිරිපිටදී අත්සන් කළ බවට සහතික කරමි.

............................................ ............................

නීතිඥ/ නොතාරිස්, දිවුරුම් කොමසාරිස් දිනය
අත්සන හා නිල මුද්‍රාව

සැලකිය යුතුය :-
උපදෙස් මාලාව

කරුණාකර අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර මෙම උපදෙස් මාලාව කියවන්න

<u>නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් එහි ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අතින් භාරදෙන්නේනම්, සතියේ බදාදා දිනවල පමණක් පැමිණ භාරදිය යුතුය.</u>

- නිවැරදිව සම්පූර්ණ කර නොමැති / අදාල ලේඛන පිටපත් අමුණා නොමැති අයදුම්පත් ලියාපදිංචි කිරීම සඳහා භාර නොගෙන ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පත් සම්බන්ධයෙන් යම් විමසීමක් කරන්නේනම්, තමන් වෙත නිකුත් කළ ලිපිගොනු අංකය සඳහන් කළ යුතුය. අයදුම්පත සම්බන්ධයෙන් පැමිණ විමසීම කිරීම සතියේ බදාදා දින වල දී පමණක් කළ හැකිවේ.
- පැවරීම සම්බන්ධ එකඟතා සහතිකය ලියාපදිංචි තැපෑලෙන් නිකුත් කරනු ලබන අතර අතින් ලබා ගන්නේ නම්, අයදුම්කරුට පමණක් සතියේ බදාදා දිනවල දී පමණක් පැමිණ ලබාගත හැකිය.
- මෙම අයදුම්පත්‍රය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.plantationindustries.gov.lk මගින් ලබා ගැනීමට හැකියාව ඇත.
- අයදුම්පතෙහි සෑම කොටුවක්ම නිවැරදිව සම්පූර්ණ කළ යුතුය

අයදුම්පත සමඟ පහත සඳහන් සහතික (අදාල පරිදි) ඉදිරිපත් කළ යුතුය

අයදුම්කරුගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු විසින් ඉල්ලීම් කරන අවස්ථාවකදී අයදුම්කරු ලෙස ඔහුගේ නම සඳහන් කළ යුතු අතර ලියාපදිංචි කළ ඇටෝර්නි බලපත්‍රයේ සහතික පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

| | |
|---|---|
| 1. සහතික | අයිතිය තහවුරු කිරීමට ඉදිරිපත් කරනු ලබන ඔප්පු හා පිඹුරුවල සහතික කළ පිටපත් * (කරුණාකර පසුපිට බලන්න)<br>අයිතිකරුට අදාල ඉඩමේ අයිතිය හිමිකම පැවරී ඇත්තේ 2005.07.22 ** දිනට පසුව නම් ඉඩමේ ඊට පෙර අයිතින් දැක්වෙන මුල් ඔප්පු හා පිඹුරුවල සහතික පිටපත් ඉදිරිපත් කළ යුතුය.<br>ඔප්පුවල දෙවන පිටපත් ඉදිරිපත් කිරීමේදී ඊට අදාල පත්ඉරු ඉදිරිපත් කළ යුතුය. |
| 2. හිමිකම් සහතික | වර්තමාන අයිතිකරුට අයිතිය හිමි වී ඇති ආකාරය දැක්වෙන වසර 10 කට වැඩි පළපුරුද්දක් ඇති නීතිඥයෙකු විසින් ඉඩම් රෙජිසිට්‍රාර් කාර්යාලයේ පත්ඉරු පරීක්ෂා කර සකස් කරන ලද හිමිකම් සහතිකය |
| 3. ඥාතීන් අතර පැවරීම | දරුවන්ට/ සහෝදරයන් අතර බෙදීමක් හෝ පවුලේ අය අතර පැවරීමක් නම්, උප්පැන්න/ විවාහ/ මරණ සහතික වල සහතික කළ පිටපත් සහ අයිතිකරු මියගොස් ඇති අවස්ථාවක ඔහුගේ උරුමකරුවන් බව තහවුරු කිරීමට ග්‍රාමසේවා සහතිකය (අදාල ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළ යුතුය) |
| 4. සම අයිතිකරුවන් | ඉඩම මිලදී ගනු ලබන්නේ එක් පුද්ගලයෙකුට වැඩි සංඛ්‍යාවක් විසින් නම්, ඔවුන් විසින් ඉඩම මිලදී ගැනීමෙන් පසුව අදාළ ඉඩම කැබලි නොකරන බවටත් වගාව පවත්වාගෙන යන බවටත් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. |

5. වෙන්දේසි ඉඩම්

වෙන්දේසි කිරීම් සඳහා මිලදී ගැනීමට අදහස් කරන්නේ නම්, අනෙක් ආයතන වලින් අවසරය ලබාගැනීමට පෙර මුලින්ම මෙම මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය.

6. රජයේ ඉඩම්

දීමනා පත්‍ර හෝ ප්‍රදාන පත්‍ර මගින් රජයේ ඉඩමක් ලැබී ඇති අවස්ථාවක එම ඉඩම් වෙනත් අයෙකුට පැවරීමේදී අදාල දීමනා පත්‍රයේ/ ප්‍රදාන පත්‍රයේ සඳහන් කොන්දේසි පිළිපැදිය යුතු වේ.
විශේෂයෙන්ම අදාල ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතියක් ඉඩම වෙනත් අයෙකුට පැවරීම සඳහා අනිවාර්යයයෙන්ම අවශ්‍ය වේ.

7. උකස

උකස් ගැනීම සඳහා සුදුසු වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතනයකි. උකස් කිරීමක් නම් උකස් කරනු ලබන ආයතනයෙන් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. උකස ගනු ලබන ආයතනය යම් හෙයකින් ඉඩම උකසට සින්න වුවහොත් එය කැබලි නොකර තනි ඒකකයක් ලෙසට පවත්වා ගන්නා බවට එම ලිපියේ සඳහන් කළ යුතුය.

8. විශේෂ ව්‍යාපෘති

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතියක් සඳහා ඉඩම පවරන්නේ නම්, එම ව්‍යාපෘති අනුමැතිය, මධ්‍යම පරිසර අධිකාරී අනුමැතිය ආදී විස්තරද, අනුමත ව්‍යාපෘති වාර්තාවද ඉදිරිපත් කළ යුතුය.

9. සමාගම් සඳහා පැවරීම

ඉඩම පැවරීම කරනු ලබන්නේ සමාගමකට නම් එම සමාගම පිළිබඳ පහත දැක්වෙන විස්තර ලේඛන අයදුම්පතට යා කළ යුතුය

i. සමාගම් රෙජිස්ට්‍රාර් වෙතින් ලබාගත් ලියාපදිංචි සහතිකය
ii. සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර, සාංගමික ව්‍යවස්ථාවලිය (Articles of Association)
iii. ඉඩම ලබාගෙන සමාගම කිරීමට යන කටයුතු දැක්වෙන ව්‍යාපෘති වාර්තාවක්
iv. ඉඩම කැබලි නොකරන බවට සමාගමේ දිවුරුම් ප්‍රකාශයක්

* සහතික කළ පිටපත්

**විශේෂයෙන් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියහොත් මිස අයදුම් පත සමඟ ඉදිරිපත් කරන සෑම සහතිකයකම මුල් පිටපත ඉදිරිපත් කළ යුතු නැත. ඒ සඳහා ඉදිරිපත් කළ යුත්තේ සත්‍ය පිටපතක් ලෙස සහතික කරන ලද පිටපතක් පමණි. මෙහිදී "සහතික කළ පිටපතක්" යනු මුල් සහතිකයෙහි ලබාගත් ඡායා පිටපතක් මුල් සහතිකය සමඟ ප්‍රසිද්ධ නොතාරිස් හා නීතිඥ වරයෙකු ලෙස ඉදිරිපත් කර මුල් පිටපත හා සසඳා බලා සත්‍ය පිටපත් ලෙසට සහතික කරවා ගත් ඡායා පිටපතකි. මෙහිදී සහතික කරනු ලබන නීතිඥවරයාගේ අත්සන හා නිල මුද්‍රාව සහතිකයෙහි සෑම පිටුවකටම යෙදිය යුතුය.**

** 2005.07.22 දින යනු 2005 අංක 20 දරණ තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) සංශෝධිත පණත බලාත්මක වන දිනයයි